# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/97/2023 (PSC)

කේ.ඒ.පී.මංජුල කුරුප්පු
**අභියාචක**
**එදිරිව**
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය :-2026.06.17**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක පුද්ගලිකවම පෙනී සිටී.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන්, සහකාර ලේකම් එන්.පී.එස්.නිලූකා කුමාරි මිය.

**-<u>නියෝගය</u>-**

## විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා

අභියාචක කේ.ඒ.පී.මංජුල කුරුප්පු යන අය විසින්, මෙම විනිශ්චය අධිකාරය වෙත 2023.05.04 වෙනි දින ඉදිරිපත් කර ඇති අභියාචනා පෙත්සමේ අවසාන ජේදයට පෙර ජේදය මඟින් ඉල්ලා ඇත්තේ, ඔහු වෙත ලබා දී ඇති ස්ථානමාරුව අවලංගු කිරීම සඳහා නියෝගයක් නිකුත් කරන ලෙසත් සහ ඔහුගේ වෘත්තීය ගෞරවයට සිදුවූ හානිය සඳහා සාධාරණයක් ඉටුකර දෙන ලෙසත් ය. වෘත්තීය ගෞරවයට වූ හානිය සම්බන්ධයෙන් සහනය ඉල්ලා ඇත්තේ, එකී අභියාචනා පෙත්සමේ 03 වෙනි ජේදයේ සඳහන් කර ඇති පරිදි, චෝදනා 03කින් සමන්විත චෝදනා පත්‍රයක් ඉදිරිපත් කර, ඒ අනුව කටයුතු කර තිබීම හේතුවෙන් බව පෙනී යයි. එම චෝදනා ඉදිරිපත් කිරීමෙන් පසු, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේද මැදිහත්වීමකින් අනතුරුව ගෙන ඇති තීරණයේ ප්‍රතිඵලය වී ඇත්තේ, අභියාචක ස්ථානමාරුවකට යටත් කර තිබීමයි. එසේ නම් අභියාචකගේ ඉල්ලීම වන්නේ, ඔහු වෙත ලබා දී ඇති ස්ථානමාරු නියෝගය අවලංගු කර දෙන ලෙසයි.

අභියාචක පවසන අන්දමට ද ඔහු වෙත ලබා දී ඇති ස්ථානමාරුව, කිසියම් පරීක්ෂණයකින් අනතුරුව ගනු ලැබූ තීරණයක ප්‍රතිපලයකි. එම තත්ත්වය යටතේ, මෙම අවස්ථාවේ දී ස්ථානමාරු සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන චක්‍රලේඛ මඟින්

නිකුත් කර ඇති රෙගුලාසි කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ. අංක 3/PP/R/PP/31 සහ 2000.02.22 දිනැති චක්‍රලේඛයේ සහ ඉන්පසු නිකුත් කරන ලද ගුරු වර්ගීකරණ චක්‍රලේඛයන්ට අනුව ගුරුවරුන්ගේ ස්ථානමාරු ක්‍රියාත්මක විය යුතුය. ඒ හැරෙන්නට අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 2007/20 හා 2007.12.13 දිනැති "**ජාතික ගුරු මාරු ප්‍රතිපත්ති**" නැමැති චක්‍රලේඛයේ 2:4 වගන්තිය ද ගුරුවරුන්ගේ ස්ථානමාරු සම්බන්ධයෙන් අදාළ වනවා ඇත. ඉදිරිපත් වී ඇති කරුණු අනුව අභියාචක අනුලා විද්‍යාලයේ වසර 10කට වැඩි කාලයක් සම්පූර්ණ කරන ලද ගුරුවරයෙකු වන්නේය. සෑම ගුරුවරයෙකු විසින්ම, එක සේවා ස්ථානයක සේවය කළ යුතු අවම සේවා කාලය වසර හයකි.

ඉහත කී චක්‍රලේඛ විධිවිධානයන්ට අනුව අභියාචක ඉල්ලා ඇති පරිදි තවදුරටත් අනුලා විද්‍යාලයේ සේවය කිරීම සඳහා ප්‍රතිපාදන සැලසී නොමැති බව පෙනී යයි. එම විධිවිධාන අභියාචකගේ ඉල්ලීමට බාධාවක් වනවා ඇත. එබැවින් මේ අවස්ථාවේ දී දෙපාර්ශවයම විසින් ඉදිරිපත් කර ඇති අනිකුත් කරුණු වලට අවධානය යොමු කිරීමට අවශ්‍ය වන්නේ නැත.

ඉහත හේතුන් සළකා බලා, අභියාචක විසින් ඉල්ලා ඇති පරිදි ලබා දී ඇති ස්ථාන මාරුව අවලංගු කිරීමට හැකියාව ලැබෙන්නේ නැත.

ඉහත කරුණු සළකා බලා ඉදිරිපත් කර ඇති අභියාචනය නිශ්ප්‍රභ කිරීමට තිරණය කරමු.

අභියාචනය නිශ්ප්‍රභ කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-